# හෝර්ටන් තැන්න ජාතික උද්‍යානය

සොබා දහමේ මහඟු දායාදයක් වූ මෙම මනරම් තලාව නැංගුරමක හැඩැති, ශ්‍රී ලංකා මධ්‍යම කඳුකරයේ ප්‍රධාන වැටියේ දකුණු මායිමට වන්නට උත්තර අක්ෂාංශ 6°.47-6°.50 හා නැගෙනහිර දේශාංශ 80°.46-80°.51 අතර පිහිටා ඇත. මුහුදු මට්ටමේ සිට මීටර් 2100-2300 අතර පිහිටි මෙය ශ්‍රී ලංකාවේ උස්ම තැනිතලා භූමිය වේ. කිරිගල් පොත්ත (මීටර් 2395) හා තොටුපලකන්ද (මීටර් 2359) මෙම ජාතික උද්‍යානය තුළ පිහිටා ඇති උස් කඳු මුදුන් වේ.

අඩයම් භූමියක් වශයෙන් විනා හෝර්ටන් තැන්න පිළිබඳ වූ දුරාතීතයට විහි දී යන ඓතිහාසික කරුණු එතරම් වාර්තා වී නොමැත. බ්‍රිතාන්‍ය ආක්‍රමණයෙන් පසු 1836 දී ශ්‍රී ලංකාව පාලනය කළ සර් රොබට් හෝර්ටන් ඔහු ගේ නමින් මෙම උද්‍යානය නම් කර ඇති බව විශ්වාස කළ හැක. ඔහු එම වසරේ ජනවාරි මස නුවරඑළියේ සංචාරයක් කිරීමට හා ඔහු ගේ හිතෛෂියෙකු වූ සබරගමු පළාතේ රටේ මහත්තයා හමුවීමට කටයුතු සම්පාදනය කොට තිබිණි. නුවරඑළියත්, රත්නපුරයත් අතර ස්ථානයක දී ඔවුන් එකිනෙකා මුණ ගැසීමට යෝජනා කරගත් අතර, එම ස්ථානය මහවැලි හෙවත් මහතැන්න (Great Plain) ලෙස නීරණය විය. මහවැලි ගගේ උපත හෝර්ටන් තැන්න ජාතික උද්‍යානය තුළ සිදුවන නිසා ඉහත සඳහන් 'මහවැලි' නැමති ස්ථානය හා මහවැලි ගඟ අතර කිසියම් සම්බන්ධතාවයක් ඇතැයි සිතිය හැක.

වර්ෂ 1969 දී හෝර්ටන් තැන්න ජාතික උද්‍යානය ප්‍රථමයෙන්ම ස්වාභාවික රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කෙරිනි. හෙක්ටයාර් 3160 කින් සමන්විත මෙම භූමි භාගය සිය නැගෙනහිර මායිමේ දී සමනළ කන්ද අභය භූමිය (Peak Wildernes Sanctuary) සමඟ සම්බන්ධ ව පවතී. මෙම ප්‍රදේශයේ ආරක්ෂාව වඩ වඩාත් වැදගත් බව අවබෝධ වීමෙන් පසු කලෙක එනම් වර්ෂ 1988 දී හෝර්ටන් තැන්න, ජාතික උද්‍යානයක තත්ත්වයට උසස් කරන ලදී

මෙම උද්‍යානය පිළිබඳ දීර්ඝ කාලීන දේශ ගුණික වාර්තා දක්නට නොමැත. නුවරඑළිය (මීටර් 1895) ප්‍රදේශයේ කාලගුණික වාර්තා වනට අනුව වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 2153 කි. වර්ෂය පුරා ක්‍රමවත් ලෙස විහිදී ගිය වර්ෂාවක් පැවතුන ද ජනවාරි හා පෙබරවාරි මාස වලදී වියලි කාලගුණයක් පවතී. මෙම කාලයේ දී දහවල් කාලයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 27 පමණ වන අතර, රාත්‍රියේ දී සෙල්සියස් අංශක 5 දක්වා පහළ බසී. 1971 දී (Muller Dombis & Perera) මනින ලද පෙබරවාරි මාසයේ සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 12 බව වාර්තා වල සඳහන් වේ. මිදුන තුෂාර පෙබරවාරි, මාර්තු මාස වල දී තෘණ බිම් මත හිමිදිරි උදයේ දැකගත හැක. වැසි සමයේ දී මුළු දවස පුරාම මිහිඳුම පවතී. නිරිත දිග මෝසම් සමයට ඉතා තද සුළඟ හා නොකඩවා ඇදහැලෙන පොද වර්ෂාව අනෙක් බොහෝ ප්‍රදේශවල දක්නට නො ලැබෙන දේශගුණික තත්ත්වයකි.

වර්ෂ 1961 දී බීජ අර්තාපල් වගා කිරීම හෝර්ටන් තැන්න ප්‍රදේශයේ ආරම්භ විය. එහෙත් පරිසරවේදීන් ගේ ව්‍යායාමයක ප්‍රතිඵල යක් වශයෙන් වර්ෂ 1969 දී එය සම්පූර්ණයෙන් ම නවතා දැමීමට හැකි විය. කෙසේ වුවද එම වසර 9 තුළ දී සිදු වූ පාරිසරික විනාශයේ ද ප්‍රතිඵල අද ද ජාතික උද්‍යානය තුළ නොයෙකුත් පරිසර ප්‍රශ්න ඇති කිරීමට හේතු වී ඇත.


**වසභ එස්. වත්තල**

සහකාර අධ්‍යක්ෂ

වන ජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව.


මෙම උද්‍යානය තුළ ප්‍රධාන වෘක්ෂලතා දි විතානයන් වර්ග 2 ක් දක්නට ලැබේ.

මෙවානම්

I. කඳුකර තණබිම් (Montane Grassland)

II. කඳුකර සදාහරිත වර්ෂා වනාන්තර (Evergreen Cloud Forest)

තෘණ බිම්වලද පහත් බිම් ප්‍රදේශ වගුරු ප්‍රජාවන්ගෙන් වැසී පවතී. මෙම ප්‍රදේශ ඇත්තෙන් ම සෙමෙන් ගලායන කුඩා දියපාරවල් ලෙස හැඳින්විය හැක. වගුරු ප්‍රජා හා ප්‍රධාන වනාන්තර අතර පිහිටි තෘණ බිම් වල විවිධ සංශ්‍රේණික අවධි වලින් යුක්ත වූ තෘණ වර්ග දැකිය හැක. විශේෂයෙන් ම මිනිසාගේ බලපෑමෙන් ඇතිවන ගිනි ගැනීම් පෙබරවාරි හා මාර්තු මාසයන් හි දී බොහෝ විට දක්නට ලැබේ. 1980 දී හා 1989 දී මෙය විශාල වශයෙන් සිදු විය. මෙම ගිනිගැනීම් ඇත්තෙන්ම වැඩිපුර බලපෑමක් ඇති කරන්නේ තෘණ බිම් කෙළවර පිහිටි විශාල වෘක්ෂයන් කෙරෙහි ය. තණ බිම් අප්‍රියෙල් මාසයේ මුල් භාගයේ දී වැසි ලැබුණ විට නැවත මුල් තත්ත්වයට ඉක්මණින් පත්වනු ඇත.

සෙමින් ගලායන දිය පහර වල කෙකටිය වර්ග, (Aponogetous Jacobsenii) දිය පාසි, බෙරලිය පාසි වර්ග (Utricularia SP.) හා දිය පහර දෙපස උණ වර්ග (Chimanobambusa Densifolia) ඉතා ඝනව වැවී තිබෙනු දැකිය හැකිය. වගුරු බිම් අසළ තෘණ වර්ග හා පර්නාංග බොහෝමයක් ඇත. (Garnotia Mutica), තෘණ වර්ගය හා (Dennstaedtia Seabra, Ericaulon SP. Exacum Maeranthums යන පර්ණාංග මින් ප්‍රධාන තැනක් ගනී.

ප්‍රධාන තෘණ භූමිවල දක්නට ලැබෙන තෘණ වර්ග අතර Arvndinella villosa හා Chvysopogoh Zeylanicus ප්‍රධාන තැනක් ගනී. කාලීන ව සිදුවන ගිනි ගැනීම් arboreum) ගස තැනින් තැන තෘණ භූමි තුළ විසිරී තිබෙනු දැකිය හැක. මේ නිසා මෙම තණ පාරවල් දිය සඳහා එළි වූ ප්‍රදේශ බොහෝ පඳුරු වර්ග දැකිය හැක. මේ අතර බෝවිටියා වර්ග (Osbeck Sp) බහුලව දක්නට ඇත.

වර්ෂා වනාන්තරයේ විශාල ගස් වර්ග අතර ශාක විශේෂ 57 ක් හඳුනාගෙන ඇත. මින් විශේෂ 29 ශ්‍රී ලංකාවට ආවේණික ශාක විශේෂ වන අතර මේ නිසා හෝර්ටන් තැන්න ජාතික උද්‍යානයේ කඳුකර සදාහරිත වර්ෂා වනාන්තර වල වෘක්ෂලතාදීන්ගෙන් 50.87% ශ්‍රී ලංකාවේ දී මිස වෙන කිසිදු රටක දී දැක ගත නොහැක. මෙම වනාන්තරයේ ප්‍රමුඛ ශාක වර්ග අතර කුරුඳු Cinnamomum Ovalitolium) කරන් දඹ (Syzygium Revolutum) කීණ (Calophyllum Walkevi) සහ මහරත් මල් (Rhododend ron Arboreum) ආදිය දක්නට ඇත.

මෙම ශාක වල අතුපතර එල්ලෙමින් පවතින ලයිකන වර්ගයක් වූ Usnea Barbata (Old Man Beard) මෙම වනාන්තරයේ සෞන්දර්යය වැඩි කරයි. ඔකිඩ් වර්ග හා පර්ණාංග ගණනාවක් මෙම ශාක මත වැඩෙනු දැකිය හැකිය. තාල වර්ගයේ ශාක දක්නට නොමැති වීම ද මෙම පරිසරයේ සුවිශේෂ ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකි ය.,

විශාල ක්ෂීරපායීන් අතර අන් ප්‍රදේශවලින්වෙන් වී ප්‍රකට ව පෙනෙන ලක්ෂණය නම් අලි ඇතුන් නොමැති වීම ය. වෙනත් කිසිදු ප්‍රදේශයක දක්නට නොලැබෙන තරම් ගෝනුන් සංඛ්‍යාවක් එකම තැනක දී බලාගත හැකි නම් ඒ හෝර්ටන් තැන්න ජාතික උද්‍යානය වේ. සමහර විට එක් රංචුවක ගෝනුන් 50 ක් පමණ දැකිය හැකිය. එමෙන්ම තිත් මුවා දක්නට නොමැති අතර, වැලිමුවා හා මීමින්නන් බහුලව ගැවසේ.

ආවේණික සතුන් විශාල සංඛ්‍යාවක් මෙම උද්‍යානයේ දී පහසුවෙන් දැක ගත හැක. ශ්‍රී ලංකාවේ ආවේණික කුරුළු වර්ග 21 න් 17 ක්ම මෙම උද්‍යානයේ සිටින බව කුරුළු සමීක්‍ෂණ වලින් අනාවරණය වී ඇත.

ආවේණික සතුන් වූ අං කටුස්සා **(Ceratophora Stoddarti)** මහ වඳුරා **(High land Bear Monkey)** මෙම පරිසරයේ ඇති අනන්‍යතාව මොනවට විදහාපායි. උභය ජීවීන් විශාල ප්‍රමාණයක් ද මෙම උද්‍යාන යෙන් දැනට සොයා ගෙන ඇති අතර, මෙම උද්‍යානයේ සත්ත්ව විවිධත්වය වෙනයම් මාතෘකාවක් යටතේ සාකච්ඡා කළයුතු දිගු විෂයකි.

අද හෝර්ටන් තැන්න ජාතික උද්‍යානය අපගේ වන ජීවී උරුමයන් රැකදෙන තෝතැන්නක් පමණක් නොවන බව අප නිරන්තරයෙන් සිහිකට යුතු වේ. මහවැලි වැනි මහා පරිමාණ වාරිමාර්ග, ජල විදුලි බලාගාර වල ඉරණම රැදී ඇත්තේ ද මෙම උද්‍යානය ජලධර ප්‍රදේශයක් ලෙස කොතෙක් දුරට ආරක්‍ෂාවේ ද යන්න මත නොවේ ද?

විශේෂයෙන්ම මහවැලි, වලවේ, කැළණි ආදී ගංගා වල ආරම්භක ප්‍රදේශ ලෙස මෙන් ම බෙලිහුල්ඔය, උමා ඔයේ ආරම්භක අතු ගංගා හා කාසල්රි ජලාශයට එකතුවන බගවන්තලාව ඔය මෙම ජාතික උද්‍යානයෙන් ආරම්භ වන අතර, වනජීවී කලාපයක් ලෙස නොව ඇත්තෙන්ම මෙම උද්‍යානය ශ්‍රී ලංකාවේ ජලධර ප්‍රදේශයක් ලෙස අප සැම දින රැක ගත යුතුය.

වර්තමානයේ ජාතික උද්‍යානය තුළ කැපී පෙනෙන ප්‍රධාන පරිසර ප්‍රශ්න 2 ක් ඇත. එනම් සමහර ප්‍රදේශ වල ගස් සම්පූර්ණ යෙන්ම මැරී යාම **(Forest Die Back)** හා ගෝනුන්ගේ සංඛ්‍යාව ඉතා විශාල වශයෙන් ඉහළ යාම වේ. මේ පිළිබඳව වඩාත් ක්‍රමවත් මෙන්ම දීර්ඝ කාලීන පර්යේෂණයන් පැවැත් විය යුතු අතර, එමගින් මෙම මූලික පරිසර ප්‍රශ්න දෙකට විසඳුම් සෙවීම කඩිනම් කළ යුතු ය.

ලොව අද මුහුණ දෙන අවදානම් පරිසර ප්‍රශ්නයක් වන "**බීමට පිරිසිදු දිය බිඳක්**" සොයා ගැනීම පිළිබඳව වූ කරතව්‍යයේ දී ශ්‍රී ලාංකිකයන් හමුවේ පවතින වැදගත්ම අභියෝගය මෙම ජාතික උද්‍යානය රැක ගැනීම නොවන්නේ ද?

**References to Literature**


1. The Montane Forest of the Horton Plains Nature Reserve.
   S. Balasubramaniam, S Ratnayake and Roger White.
2. An formal Survey of Sri Lanka Dr. S.W. Kotagama
3. Lorris Vol XII No: 02

XVI No: 01